

# විලාසම

# விலாசம்

# Vilasam





# මනාලියන් බලන්න ඇවිත් ගෙවල් මාරු වුණා



**සෙල්ලන් පාච්චියම්මා**

අවුරුදු 42 ක් මම කම්කරුවෙක් හැටියට මේ වත්තේ සේවය කරනවා. ඒ කාලය ඇතුළත ලිපියක් ලැබිල නැහැ. හදිසි ටෙලිග්‍රෑම් එකක්වත් ලැබිල නැහැ.  මනාලියක් බලන්න එන වෙලාවට වැරදිලා වෙන ගෙවල්වලට ගිහින් තිබුණා. යාලුවොන් වගේ ම ඥාතීන්ටත් අපේ ගෙදර හොයා ගන්න බැරිවෙලා ගෙවල් මාරු වෙලා තිබුණා. ලිපිනයක් ලැබීම සතුටක්..



# ගරුත්වයක් ලැබිලා

**බී. ලලිතා - පෙරපාසල් ආචාරිනී**

මම පෙරපාසල් ගුරුවරියක් ලෙස කටයුතු කරනවා.නූතන සමජයක් ජයග්‍රාහීව ගොඩක් ඉදිරියට යමිනුයි තිබෙන්නේ. නමුත් අපේ සමාජයට ලිපිනයක් ලබා ගැනීමත් ළඟාකර ගත නොහැකි දෙයක් වෙලා. අද ලිපිනය ලැබීම හේතුයෙවන් රටේ ගෞරවනීය පුරවැසියෙක් හැටියට ජීවත් වෙන්න මඟ පෑදිලා.. විකල්පල ප්‍රතිපත්ති කෙන්ද්‍රයටත් වතු අධිකාරිතුමන්ටත් ස්තූතියි.


"විලාසම" යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතු ව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක ව විමර්ශනයට භාජනය කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

"විලාසම" ප්‍රකාශනය, ශ්‍රී ලංකාවේ ගැටුම් විසඳා ගැනීමට බෙහෙවින් අදාළ වන ප්‍රශ්න පිළිබඳ ව, අපගේ සාම හා ගැටුම් විශ්ලේෂණ වැඩසටහන හා පොදු මහජනතාව ද අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇතිකරවීමේ එක් මගකි. මෙහි අන්තර්ගත අදහස් මගින් අවශ්‍යයෙන් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ අදහස් පිළිබිඹු නො වේ.



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2081384/06 ෆැක්ස් 94-11-4714460 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org




# விலாசம்
# විලාසම

වතු කම්කරු පවුල් සඳහා
ස්ථිර ලිපිනයන් ලබාදීමේ සමාජ සත්කාරය

2016 මාර්තු 05

## මොකා වත්ත
## මස්කෙළිය


පරිගණක සැකැස්ම **වාකයා රූ** දු.ඇ. 011-2708377

මුද්‍රණය **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්** දු.ඇ. 0777-315971

ඡායාරූප **එම්. ප්‍රදීපන්**







# ලිපිනය අහිමි වතු කම්කරුවන්ට ස්ථිර ලිපිනයක්

ලිපිනය අහිමි වතු කම්කරුවන්ට ස්ථිර ලිපින ලබාදීමේ වැඩසටහන ප්‍රථමයෙන් ම ක්‍රියාත්මක කරනු ලැබුවේ 2013 දී බදුල්ල දිස්ත්‍රික්කයේ ය.

මෙවර මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගනු ලැබුයේ අඹගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් 'මොකා වත්ත' වතු යායයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සහයෝගය ඇතිව මොකාවත්ත පුරවැසි සභා එකමුතුව විසින් මොකා වත්ත වතු අධිකාරියේ සහ වර්ල්ඩ් විෂන් ආයතනයේ සහයෝගයෙන් මෙය ක්‍රියාත්මක කරන ලදී.

මෙයින් ප්‍රතිලාභ අත්වන පුරවැසියන් සංඛ්‍යාව 1000 කට අධික වේ. අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් වශයෙන් ලිපිනයන් ලබා දීමේ දෙවන අදියරේ සාර්ථකත්වය, දීප ව්‍යාප්ත මහජන වැඩසටහනක් සඳහා පිටුබලය සපයනු ඇත.

අඹගමුව ප්‍රාදේශීය සභාව, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මොකා වත්ත වතු අධිකාරිය, අදාළ මොකා වත්ත ග්‍රාමනිලධාරී සහ මස්කෙළිය පොලිසිය ඇතුළු ආයතන ගණනාවක් මෙහි හවුල්කාරයන් වශයෙන් කටයුතු කර ඇත.


වතු කම්කරුවන්ට නිශ්චිත ලිපිනයක් සහතික කිරීම, එම ලිපිනයට නියමිත පිරිදි සාමාන්‍ය තැපැල් ක්‍රමය යටතේ ම ලියුම් ලැබෙන්නට සැලැස්වීම මෙහි ඉලක්කයයි.



# ලිපිනයක් ලැබීම පුරවැසියාගේ මූලික අයිතිවාසිකමක්

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු
විධායක අධ්‍යක්ෂ,
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය





දහසකට අධික පවුල් සංස්ථාවකට ලිපිනයන් ලබාදීම වෙනුවෙන් මධ්‍යම පළාතේ මොකා වත්ත වතු යාය කේන්ද්‍ර කරගෙන සිදු කරනු ලබන මෙම වැඩ සටහනට සම්බන්ධ විම පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වඩාත් ම සතුටට මෙන් ම ආඩම්බරයට පත් වෙන බව සඳහන් කළ යුතු ය. ලිපිනයන් ලබාදීමේ වැඩසටහනක් මධ්‍යම පළාත කේන්ද්‍ර කරගෙන සිදු වන්නේ මුල් වරට ය. ඌව පළාතේ පස්සර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවුල් 4500 කට කලින් අවස්ථාවනක දී ලිපිනයන් ලබාදීමට කටයුතු කළ අතර එහි පූර්වාදර්ශයක් ලෙස මෙම වැඩසටන ක්‍රියාත්මක වේ.

පුද්ගලයෙකුට ලිපිනයක් නොමැති තත්ත්වය අනුව අප රටෙහි මානව අයිතිවාසිකම් වලට හිමි ස්ථානය කෙබඳුදැයි වටහා ගත් හැකි ය. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව කඩිනමින් මැදිහත් විය යුතු අතර මෙම තත්ත්වය නැති කිරීම සඳහා නොපමාව පියවර ගත යුතු ය. එසේ ම සිවිල් සමාජය ද මෙවැනි තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහා සක්‍රීයව මැදිහත් විය යුතු ය.

අවිශායි මාර්ගලට් (*Avishai Margalit*) නම් දාර්ශනිකයා මෙසේ පවසයි. 'ශිෂ්ඨ සම්පන්න සමාජයක ජනතාව අවමානයට පත් කරන ආයතන නොමැත.' මෙය ජනතාවගේ මූලික අයිතිවාසිකමකි.





# අනන්‍යතාවට ගරු කිරීමක්

ලයනල් ගුරුගේ
ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ ප්‍රධානී



ජාතික ආර්ථිකයට මහඟු දායකත්වයක් එක් කරමින් තේ වතු කර්මාන්තයට ජීවය පිඹින සුවිශේෂී ජන කොට්ඨාසයක් හැටියට වතු කම්කරු ප්‍රජාව බුහුමනට නිස්සෝය. එහෙත් බ්‍රිතාන්‍ය යටත් විජිතය විසින් වතු කර්මාන්තයට අවශ්‍ය ශ්‍රම බලකාය නිර්මාණය කර ගැනීමේ අරමුණින් දකුණු ඉන්දියානුවන් මෙරටට ගෙන් වූ දා පටන් වර්තමානය වන තෙක්ම ඔවුන්ගේ ජන දිවිය දුක්ඛිත තත්වයෙන් මුදවා ගැනීමේ විධිමත් වැඩ පිළිවෙළක් දියත් කිරීමට අධිරාජ්‍යවාදී පාලකයෝ මෙන්ම දේශීය පාලකයෝද අසමත් වූහ. එනිසා, ඔවුන් තවමත් ජීවත්වනුයේ සෞඛ්‍යාරක්ෂිත  වටපිටාවක් නොමැති සීමිත වපසරියක් සහිත ලැයිම් කාමරවල ය.

එම පවුල්වල දරුවන්ට ඇති අධ්‍යාපන අවස්ථා සීමා සහිත ය. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහලක් වෙත යෑම දුෂ්කර හා වෙහෙසකර ගමනකි. දෛනික වැටුප් ලබන මේ කම්කරුවන්ට සේවක අර්ථසාදක අරමුදලේ ප්‍රතිලාභ පවා අහිමි කර ඇත්තේ වතුවල ආදායම් පහළ ගොස් ඇත යන චෝදනාව නගමිනි. එහෙත් ඔවුන්ගේ වැටුපෙන් වාරික අයකර ගැනීම ද සිදුවේ.



ලංකාවේ සෑම පුරවැසියකුටම ලැබෙන තැපැල් සේවය වතු කම්කරුවන් වෙත ලැබෙනුයේ මන්දගාමීව ය. නො එසේ නම් ලැබෙන්නේ ම නැත. මේ නිසා රජයේ විභාග, සම්මුඛ පරීක්ෂණ යනාදී ඉතාමත් වැදගත් අවස්ථාවන් පවා ඔවුන්ට අහිමිව යන තත්වයක් පැන නැගී ඇත්තේ නියමිත දිනට ප්‍රමාද වී ලිපි ලැබෙන හෙයිනි. මෙය දුක්ඛිත තත්වයකි. සමාන පුරවැසියන් හැටියට පිළිගැනීම ව්‍යවස්ථාවට පමණක් සීමා කිරීමකි.

30 වසරක යුද්ධය නිමා කිරීමෙන් පසුව වත්මන් ජනාධිපතිවරයා විසින් පත්කරන ලද ප්‍රතිසන්ධාන කොමිසම 9.200 ඡේදයෙහි මෙසේ කරුණු දක්වයි.

වතු ප්‍රදේශවල අධ්‍යාපන, සෞඛ්‍ය ගැටලු සහ ජීවන දුෂ්කරතා ගැන ඔවුන් කොමිසමට කරුණු දක්වා ඇත. පහසුකම් සහ වඩා හොඳ ජීවන තත්වයක් ඇති කිරීමටත් ආණ්ඩුව පියවර ගත යුතු බව කොමිසම නිර්දේශ කරයි. මේ සියලු කරුණු අනුව මේ පහසුකම් ලබාදීම ජාතික යුතුකමකි. ඔවුන්ගේ අනන්‍යතාවට ගරු කිරීමකි.



# விலாசம் විලාසම



## ක්‍රමවේදය

වතු කම්කරුවන්ට ලිපිනයන් සකස් කර දෙමින් ඔවුන්ට අභිමානයක් ඇතිකර දීමේ යෝජනාව ඉදිරිපත් වූයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙනි. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියරෙහි දී මොකාවත්ත වතු යායේ ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන ලදී. නිවැසියන් හමුව සාකච්ඡා කොට ඔවුන්ගේ අදහස් උදහස්, අභිලාෂ අවබෝධ කර ගැනීමට උත්සාහ දැරීම එලදායක විය. ගැටලුව හඳුනා ගැනීම එහි අපේක්ෂාව විය.

මෙම කටයුත්ත මුල් කරගෙන පුරවැසි සභා පිහිටුවා ගැනීම සිදු වූ අතර පුරවැසි සභා ඔස්සේ පවතින ගැටලු හඳුනා ගැනීම සහ ලිපිනයන් ලබා දීමේ කටයුත්ත සම්බන්ධීකරණය පහසු විය.

මොකා වත්ත වතු යායේ ඉහළ කොටස, පහල කොටස, සීමා වත්ත සහ ඇඩම්ස්පීක් යන ප්‍රදේශයන් හි පදිංචි දහසකට ආසන්න පවුල් සංඛ්‍යාවකට ලිපිනයන් ලබාදීම මෙහි දී සිදු විය.

ලැයිම් හඳුන්වා දීම සඳහා එතෙක් භාවිත කරන ලද ඇතැම් නම් පුරවැසියන් කොන් වූ පිරිසක් හැටියට සැලකීමට හේතු විය. මෙය අධ්‍යාපනය ලබන දරුවන්ගේ පසුගාමීත්වය සහ ආත්ම ගෞරවය පලුදු වීම කෙරෙහි බල පා තිබුණි. වීදි නාමයන් ද නිශ්චිතව නොවීම තවත් ගැටලුවක් විය.

පෝට්ටල් ලැයිම, ස්ටෝර් ලැයිම, කෝවිල් ලැයිම, නො 12 ලැයිම ආදී නම් වෙනුවට පිළිවෙලින් 'මධුරා පුරම්, කම්බන් පුරම්, සිවනොලි පුරම් සහ කන්‍යා පුරම්' ආදී අලුත් නම් යෝජනා කෙරුණි. භාවිතයට සුදුසු එතෙක් පැවති සමහර නම් එලෙසම භාවිතයට ගැනීම සිදු කෙරිණි.

බගවති පාර, කුට්‍රාලම් පාර, ෆැක්ටෙරි පාර, ඉස්පිරිතාල පාර, පන්සැල් පාර, සන්ගමන් පාර, පාසල් පාර, ක්‍රිෂ්නා පාර ආදී වශයෙන් වතු මාර්ග නම් කෙරුණ අතර වසන්තම් පුරම්, කන්නියා පුරම්, එල්ලි පුරම්, ගාන්ධි පුරම්, ලක්‍ෂමී පුරම්, පොන්නොලි පුරම්, ක්‍රිෂ්ණා පුරම්, පරශක්ති පුරම්, කලයිවානි පුරම්, අන්නයිපුරම්, ශාන්ති පුරම්, සෞම්‍ය පුරම්, භාරති පුරම් ආදී වශයෙන් ඒ ලැයිම් නම් කෙරිණි.





# ලිපිනයක් ලබාගැනීම ඔවුන්ගේ අයිතියක්

ඊ.ආර්. බුලත්සිංහල - වතු අධිකාරී,
මොකා වත්ත, මස් කෙළිය





‘‘මම මේ වත්තේ වැඩ බාර ගත්තේ 2014 සැප්තැම්බර් 1 වෙනිදා. අනෙක් සමාජ සමඟ සන් සන්දනය කළාම මා දුටුව එක දෙයක් තමා වතු ජනතාවට තමන්ගේ කියලා ආත්ම ගරුත්වයක් නෑ කියන එක. අඩුම තරමින් ඔවුන්ට ලිපිනයක්වත් නැහැ. වතු දරුවන් ඉගෙන ගන්නවා, ඇතැම් අය කොළඹ රැකියා කරනවා, ඒ අවස්ථාවලදී ලිපිනය ගැන විමසුවොත් කියන්න ලිපිනයක් නැහැ. එතකොට ගොඩක්ම අපහසුතාවයට ඔවුන් පත් වෙනවා. ඔවුන් කියන්නේ, ‘අර වත්තේ, උඩ ලැයිමේ, යට ලැයිමේ’ ආදී දේවල්. මේ පිළිබඳ මම ගොඩක් කල්පනා කළා. මේ ගැන හිත හිත ඉන්නකොට තමා වර්ල්ඩ් විෂන් ආයතනයේ නොයෙල් මහතා මට මුණ ගැසුණේ. ඔහු තමා මට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නිලධාරීන්ව හඳුන්වලා දුන්නේ. එහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙනුවෙන් ප්‍රදීපන් මහතා තමා මා සමඟ වැඩ කළේ. ඔහු මා සමඟ එක් ව මේ පිළිබඳව ජනතාව දැනුවත් කරන්න විශාල වෙහෙසක් ගත්තා. මෙහෙම දෙයක් කරන්නේ ඇයි කියලා මිනිසුන්ට තේරුම්

# விலாசம்
# විලාසම





කර දිය යුතු වුණා. එහදී විශාල ප්‍රශ්න විරෝධතා ආවා. ඉතින් ප්‍රදීපන් මහතාගෙන් ලැබුණ දායකත්වයත් සමඟ මෙය සිදු කරන්න පුළුවන් වුණා. මාර්තු 5 වෙනිදා මා සේවය කරන වත්තේ, ඇඩම්ස් ස්පීක් කියන ඩිවිෂන් එකේ සියලු ම නිවාසවලට නොම්බර් එකක් දීලා, ගැසට් කරලා, තැපැල් කාර්යාලයට දන්වලා ලිපිනයන් ලබාදීම සිදු කරනවා. මට විශේෂයෙන් ම ඕන වුණේ මේ අයට ගරුත්වයක් ලබා දෙන්නයි. ලියුම් වෙලාවට ලැබුණෙ නැතිවුණාම මේ ජනතාට බොහෝ අසීරුතාවන්ට මුහුණ දීලා තියනවා. සමහරුන්ට රැකියා සම්මුඛ පරීක්ෂණ සඳහා යන්න තිබුණ අවස්ථා නැතිවෙලා තිබෙනවා. රත්තරන් බඩු උකස් කරලා ඒ පිළිබඳ ලිපි වෙලාවට ලැබුණේ නැති වුණාම, රත්‍රං බඩු සින්න වෙලා තිබෙනවා. ඉතින් මේ ජනතාවට ලිපිනයක් ලබා ගැනීමේ අයිතියක් තිබෙනවා. ඉතින් මේ ලිපිනයල් ලබාදීමේ වැඩේ සාර්ථකවෙයි කියා මා හිතනවා. වතු ජනයා සමාජයේ අනෙක් ජනතාවගේ තත්ත්වයට පත් කිරීම තමා මූලික පරමාර්ථය.''





விலாசம்
විලාසම

# මට ගොඩක් පහසු වෙනවා

ජේ. සිල්වෙස්ටර් - ප්‍රදේශයේ ලියුම් බෙදන්නා



''මම අවුරුදු 8ක් විතර මෙම ප්‍රදේශයේ වැඩ කරනවා. ලිපිනයන් ලාබදීමේ ක්‍රියාවලිය වැදගත් කියලයි මම හිතන්නේ. මෙම ප්‍රදේශයේ සේවය කරද්දි මම ගොඩක් ම අපහසුතාවයට ලක් වෙනවා. හැමෝටම ලියුම් එන්නේ මොකා වත්ත, මස්කෙළිය කියලා. එකම නම තිබෙන අය ගොඩක් සිටින නිසා ලියුම් බෙදීම අසීරුයි. මේ වත්තේ ආරුමුගම් කියල පස් දෙනෙක් ඉන්නවා. හතර දෙනෙක් ම නම ඒ. ආරුමුගම්. ඉතින් ගැටලු ගොඩකට මුහුණ දෙන්න වෙනවා. අංකයක් සහිත ලිපිනයක් දෙනවනම් මට ගොඩක් පහසුයි. රිටර්න් වන ලියුමක් නැවත භාරදීමේ දී ගොඩක් වෙහෙසෙන්න වෙනවා.  ශිෂ්‍ය හැඳුනුම්පත් ඉස්සර ආවේ ග්‍රාමනිලධාරීට. දැන් ඒවා බෙදන්න වෙන්නේ මට. අදාළ පාසල්වලට ගිහින් දෙන්නත් බැහැ, ඔවුන් පාසල් හැර ගිහිපු අය නිසා. ඉතින් වත්තේ හැම තැනම ඇවිදින්න වෙනවා. ලියුම කඩල අදාළ පුද්ගලයගේ මූණවත් බලල හැඳුනුම්පත් ලබා දෙන්න මට අයිතියක් නැහැ.

ඒ වගේ ම සංවර්ධ කටයුතුවලට අදාළ ලියුම් විවිධ ආයතනවලින් එනවා. ඒවා හරියට බෙදා ගන්න වෙන්නේ නැහැ. ඉතින් ඒ කටයුතු ආඩාල වෙලා. සමහර ආයතන ණය පහසුකම් දෙනවා. නමුත් අදාළ ලිපි වෙලාවට දෙන්න බැරි වෙනවා. මිනිසුන්ට වෙන අපහසුතා සහ මම විඳින අපහසුතා නිසා වෙලාවකට මෙහෙම දුක් විඳ විඳ වැඩ කරන්නේ ඇයිද කියලා හිතෙනවා.

මේ සංවිධාන එකතුවෙලා කරන ක්‍රියාව නිවැරදිව සිදු වුව හොත් එය මහඟු දෙයක්. මේ ගම්වලට වැඩ කරන ආයතනවලට ගම වෙනුවෙන් වැඩ කිරීම පහසු වෙනවා. මෙය ඉතා හොඳ දෙයක්. මේ සඳහා සියලු නිලධාරීන් දායකත්වය ලබා දිය යුතුයි. ඉතින් මේ වත්තට ලියුම් බෙදන්නා හැටියට මම ගොඩක් ම සතුටු වෙනවා.''



# අනන්‍යතාවය තහවුරු වෙන්නෙ ලිපිනයෙන්

මන්ගප්පන් රාජේන්ද්‍රන්
උප පොලිස් ස්ථානාධිපති
මස්කෙළිය.



''මස්කෙළිය කියන්නේ ශ්‍රී පාද කන්ද පාමුල තිබෙන සොඳුරු ප්‍රදේශයක්. මෙහි ග්‍රාමනිලධාරී කොට්ඨාස 08ක් පමණ තිබෙනවා. මොකා ග්‍රාමනිලධාරී කොට්ඨාසය මස්කෙළියේ සිට කිලෝ මීටර් 12ක් පමණ දුරින් පිහිටා තිබෙනවා. මොකා ගම්මානය කියන්නේ මාර්ග සංවර්ධනය පවා සිදු නොවුණ බොහොම ගැටලු තිබෙන ප්‍රදේශයක්. නොයෙක් රාජ්‍ය නොවන සංවිධාන මේ ප්‍රදේශය තෝරාගෙන මෙහි ජන ජීවිතය නගාසිටුවන්න කටයුතු කරනවා.

ඒ අනුව එක් සංවිධානයක් මිනිසුන්ගේ ලිපිනයන් නැති අවශ්‍යතාව හඳුනාගෙන පුරවැසියන් සමඟ ඒ වෙනුවෙන් කටයුතු කරනවා. මොකා ප්‍රදේශයට විරතක් නෙමේ, සියලු ම වතු ප්‍රදේශයන්ට ලිපිනයන් තිබීම වැදගත් කාරණාවක්. පුද්ගලයකුගේ අනන්‍යතාවය තහවුරු වෙන්නේ ලිපිනයෙන්. ලිපිනයක් ලැබුණොත් පුද්ගල ජීවිතේ නොයෙක් වෙනස්කම් වෙන්න එය බලපානවා. ඒ අනුව මොකා ප්‍රදේශය මේ සඳහා තේරාගෙන තිබීම බෙහෙවින් ම වැදගත් දෙයක්.

ලිපිනයන් නොමැති වතු ජනයා බොහෝ අපහසුතාවන්ට පත් වෙනවා. වතු මාර්ගයන්ට නම් යොදා ලැයිම් ජීවිත වෙනස් කිරීම වෙනුවෙන් ලිපිනයක් ලබාදීමට කටයුතු කිරීම සතුටු දායක දෙයක්. ඒ වගේම යම් ප්‍රශ්නයයකදී පුද්ගලයෙක් හඳුනාගැනීමට යාමේ දී පොලිසිය බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙනවා. සිතාසියක් භාරදීම සඳහා ලිපිනයක් තිබීම වැදගත්. නැත්නම් පොලිසිය වගේ ම ජනතාවත් අපහසුතාවයට පත් වෙනවා.

ඒ වගේම වෙනත් ප්‍රදේශවලින් ලැබෙන පැමිණිලි වලට අනුව කටයුතු කිරීමේදී අපහසුතා ඇතිවෙනවා. මෑතකාලීන සිදුවීමක් වුණා. මේ වතු ප්‍රදේශයේ පුද්ගලයෙකුගේ පුතෙක් කොළඹ ප්‍රදේශයේදී අත්තඩංගුවට අරගෙන. ඊබ ව අපට කොළඹින් දැන්වුවා, අදාළ නිවසට දන්වන්න කියලා. නමුත් ලිපිනයක් නැතිකමින් හරියට කුමන ගෙදරද කියා සොයන්න බැහැ. නිසි වේලාවට ඒ පිළිබඳ දන්වන්න නොහැකි වුණොත් ඒ දරුවට ඇප ගන්න ලැබෙන්නේ නැහැ. දවස් 14ක් අත්තඩංගුවේ සිටින්න වෙනවා. මේ සියලු ගැටලු ඇති වෙන්නේ ලිපිනයක් නොමැති නිසයි.

එසේ ම දරුවන්ට ශිෂ්‍යාධාර ලැබෙන ඒවත් ලිපිනයනක් නොමැති කමින් ආපසු යනවා. එවැනි අවස්ථාවන්වලදී නිශ්චිතව ලිපිනය ලියන්න කියල ඇතැමුන් සඳහන් කළත් එසේ නිවරදි ලිපින කාටවත් නැහැ. කෙසේ හෝ හැම නිවසකටම ලිපිනයක් ලබාදීම සැබැවින් ම සතුටට කාරණයක්.''





# ලිපිනයන් ලබාදීමට වතුකර දේශපාලනඥයින් පෙරමුණ ගත යුතුයි..

*වී. ඇන්ටනී ප්‍රනාන්දු*
*විදුහල්පති, මොකා වත්ත දෙමළ විද්‍යාලය*



``මොකා වත්ත දෙමළ විද්‍යාලයේ වගේ ම මොකා වත්ත සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපති හැටියටත් මම කටයුතු කරනවා. මා මේ මොහොතේ බෙහෙවින් ම සතුටට පත් වෙනයවා වතුකරයේ, මොකා වත්තේ ජනතාවට ලිපිනයන් ලැබීම පිළිබඳව. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගම්මාන වන මොකා ග්‍රාමනිලධාරි කොට්ඨාසය හා ගාඩ්මෝර් කොට්ඨාස ඉතාම දුෂ්කර ප්‍රදේශයන්. මෙම ප්‍රදේශයන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් නොයකේ සිවිල් සංවිධාන මැදිහත්වීම සතුටට කරුණක්. විශේෂයෙන් ම වර්ල්ඩ් විෂන් වැනි ආයතනය මේ ප්‍රදේශයට ලබා දුන් දායකත්වයට ගරු කළ යුතුයි. මොකා වත්ත් ඉහළ කොටස, මොකා වත්ත පහළ කොටස, ඇඩම්ස්පීක් කොටස සහ මිග්ලොයිඩ් යන ප්‍රදේශවල ජනතාවගේ ජීවිත නගාසිටුවීම සඳහා මොකා වතු අධිකාරියේ මැදිහත්වීමෙන් කරන දේවල් වඩාත් සාර්ථක බව කියන්න පුළුවන්. මේ වතු ප්‍රදේශයේ 5000ක් තරම් ජනතාවක් සිටිනවා. ශිෂ්‍යයින් 700ක් පමණ සිටිනවා. මේ ප්‍රදේශය සීඝ්‍රයෙන් දියුණු කළ යුතුයි. ඒ සඳහා රෝහලක්, තැපැල් කාර්යාලයක්, සපුමාකාරයක්, බැංකු පද්ධතියක් ලැබෙයි ද කියන ගැටලුව තිබෙනවා. ජනතාව සිය අවශ්‍යතා වෙනුවෙන් කිලෝ මීටර් 30ක් තරම් දුර ගෙවාගෙන හැටන් නගරයට යනවා. එම ගමන් බිමන්වලටම විශාල මුදලක් වැය වෙනවා. සියලු පහසුකම් මේ ප්‍රදේශයේ තිබේ නම් එම නිකරුණේ වියදම් වන මුදල් ජනතාවගේ ජීවිත සංවර්ධනය සඳහා යොදවන්න පුළුවන්.

එක් එක් නිවාසවලට ලිපිනයක් තිබීම ජීවිත සංවර්ධනයේ දී ප්‍රධාන කාරණයක්. මොකා වතු අධිකාරිය සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක් ව මාර්තු 05 වන දින මෙම ලිපින ලබාදීමේ වැඩසටහන ජනගත කරන්න යනවා. මෙය මොකා වත්තේ ජනතාවට බොහෝ සතුටු දායක කාරණාවක්.

මෙම ලිපින ලබාදීම ඔස්සේ වතුකර ජනයාගේ අනන්‍යතාව ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ප්‍රශංසනය වෙනවා. එය ඉතා හොඳ දෙයක්. ලිපිනයන් ලබාදීම නිසා වතුකර ජනතාවට නාගරික ප්‍රදේශයන්ට සමාන තත්වයක් ලැබෙනවා වගේ ම ප්‍රාදේශීය සභාවේ සේවාවන් ලබා ගැනීමටත් එය හේතු වෙනවා. එම නිසා මොකා වතු අධිකාරි



# නොලැබුණු සිහිනයක්

පී. රංගරාජ් - සභාපති
ඇඩම්ස්පීක් පුරවැසි සභාව



බුලත්සිංහල මහතාගේ කැපකිරීම අගය කළ යුතුයි. ඔහු නිතර වතු ජනතාවගේ ජීවිත සංවර්ධනය කළ යුතු බව පවසනවා. වතු ජනතාවට හොඳ කල දවසක් උදා වෙන්නේ ඔවුන්ගේ ජීවිත සංවර්ධනය කිරීම ඔස්සේ බව ඔහු නිතර ම සඳහන් කරනවා.

ඒ වගේ ම විකල් ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ක්ෂේත්‍ර නිලධාරියෙකු වන ප්‍රදීපන් මහතා වතු අධිකාරී තුමන් සමඟ එක් ව මාස තුනක් තිස්සේ මේ වෙනුවෙන් වෙහෙස වුණා. මම අවුරුදු 21 ක් තිස්සේ මේ ප්‍රදේශයේ වැඩ කරන විදුහල්පති හැටියට වතු ජනතාවගේ අභිවෘද්ධිය ගැන නිතර හිතනවා. ඒ නිසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ වර්ල්ඩ් විෂන් වැනි ආයතනවලට මම ස්තූති වන්ත වෙනවා. එසේ ම මෙවැනි ආයතන වතුකරයේ අනෙකුත් සියලු ම වතු වල ජනතාවට ලිපිනයන් ලාබදීමට කටයුතු කරන්නේ නම් වඩාත් හොඳයි. ඒ නිසා වතුකර දේශපාලනඥයින්ගෙන් මා ඉල්ලා සිටින්නේ මේ කටයුත්ත වෙනුවෙන් කඩිනමින් පෙරමුණ ගන්නා ලෙසයි.''

''මම දන්න කාලෙ ඉඳලම මේ වත්තේ කාටවත් සෘජුවම ලිපියක් ලැබී නැහැ. ඒ අනුව මොකා වත්තේ වතු අධිකාරිය ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගය ඇතිව ලිපිනයන් ලබාදීමට කටයුතු කර තිබෙනවා. එය සතුටට හේතුවක් වගේම අගය කළ යුතු දෙයක්. ලිපිනයක් කියන්නේ වතුකරේ අපට නොලැබුණ සිහිනයක්. මේ නිසා මොකා වතු යායේ සියලුම ජනතාව සතුටට පත් වෙනවා. අපේ අනාගත පරපුරට ලිපි ලැබේවි. ප්‍රශ් ගොඩක් විසඳේවි. නිවාසයකට අලුත් අංකයක් දීලා, තමන්ගෙම කියල ලිපිනයක් දැන් තියෙනවා. මේ වැඩේට මැදිහත් වෙච්ච සංවිධාන, වතු අධිකාරියට සහ පුරවැසි සභාවලට අපේ ගෞරවය හිමි වෙනවා.''




விலாசம்
විලාසම

# ජන ජීවිතවලට වැදගත් අවස්ථාවක්

ආර්.එම්. සිසි කුමාරි
මොකාවත්ත ග්‍රාමනිලධාරී තුමිය






"මොකා ග්‍රාමනිලධාරී වසම කියන්නේ ඉතා දුෂ්කර ග්‍රාමනිලධාරී වසමක්. මෙම ලිපිනයන් ලබා දීම සම්බන්ධයෙන් කරගෙන යන වැඩසටහන සාර්ථක වැඩසටහනක් වගේ ම ඉතා ම අත්‍යාවශ්‍ය දෙයක්. මොකද එකම නම තිබෙන කීප දෙනෙක් ම මෙම මොකා වත්තේ ඉන්නවා. මොකා වත්තේ බොහොමයක් ම තිබෙන්නේ ලැයින් කාමර. එක ලැයිමක එක නම තියන බොහෝ පිරිසක් ඉන්නවා. නොම්බරයක් සහිතව ලිපිනයක් ලාබා දීම කාලීනව බොහොම වැදගත් දෙයක්. දැන් තියෙන තත්ත්වය අනුව ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ දී මොකා වත්ත කියල තමා අපි ලිපනය නම් කරන්නේ. එක ම නමින් කීප දෙනෙක් ඉන්න නින්දා ගැටලුවලට මුහුණ දෙන්න සිදු වෙනවා. ඉන්ටර්වීව් එකකට ලිපියක් ආවත් ඒක නිශ්චිතව ම අදාළ පුද්ගලයාට දීමට නොහැකි වෙනවා. අත්‍යාවශ්‍ය කාරණා බොහොමයකදී ම ලිපිනය නොමැති ප්‍රශ්නය නිසා මිනිසුන් ගැටලුවලට මුහුණ දෙනවා. මොකා වත්තේ තිබෙන භූගෝලීය පිහිටීමත්, නගරයට තිබෙන දුර ප්‍රමාණය නිසාත් ලිපිනයක් ලබාදීම මිනිසුන්ගේ ජන ජීවිතවලට වඩාත් ප්‍රයෝජනවත් වේවි. ඒ නිසා මෙම ලිපිනය ලබාදීමේ වැඩසටහන ගොඩක් ම හොඳ දෙයක් හැටියටයි මම දකින්නේ."



# අපිටත් අයිතියක්

එස්. නිදර්ශන් - සිසුවෙක්

අපේ වත්ත ගමක් වීම තුළින් අපිත් මේ රටේ අයිතියක් තියෙන පුද්ගලයන් බවට පත් වෙනවා. ලංකාවේ ආර්ථිකයට ලොකු සේවාවක් කරන්නේ අපේ දෙමාපියන්.. අපිට ලිපිනයක් ලැබීම ලොකු සතුටක්



# වැරදි වෙන එකක් නැහැ

පෙරුමාල් මහේන්ද්‍රන් - සභාපති
පුරවැසි සභාව

''පුරවැසි සභා හරා ලිපිනයන් ලබාදීමේ වැඩ සටහනක් කරගෙන යනවා. ඇත්තට ම අවුරු 200ක ඉතිහාසයක ඉඳල අපිට ලිපිනයක් තිබුණේ නැහැ. දැන් අපි ගමේ පුරවැසි සභා පිහිටුවාගෙන මේ කටයුත්ත කළා. ඒ සඳහා වතු අධිකාරිය සහයෝගය ලබා දුන්නා. ඉස්සර විදුලිය ලබා දෙන්න අපේ වත්තට ලැයිටි කණු ආවා. අපේ වත්තට ලැබෙන්න ඕන ලැයිටි කණු 'මෝරා' වත්ත කියල වෙන වත්තකටයි ලැබුණේ. පුසව අපි ඉල්ලීම් කරල ඒක ලබා ගත්තා. දැන් ඒ වගේ වැරදි සිදු වෙන එකක් නැහැ. රැකියා ලබා ගැනීමේදී ද ලිපිනය නැතිකම ගැටලුවක් වෙලා තිබෙනවා. වතු අධිකාරිය. නිලධාරී මණ්ඩලය, පුරවැසි සභාවල සාමජිකයින් මෙහිදී සිහිපත් කළ යුතුයි.''

# කරුමය වෙනස් කරමු

ලිපිනයක් නැති
ආගන්තුකයන් හැටියට
ආනයනය කළේ අපි
ඉන්දියාවෙන්..

ලේ වැගිරී
ඇග වෙහෙසී
ශ්‍රමය වැගිරුවා
අයිතියක් නොමැතිව..

අදින් පසු
තදින් කියමු
ලෝකයට
අයිතියක් ඇති
නිවාසයක් සමඟ
අපිටත් උරුමයක් ඇති බව..

වෙනස්වන
මහපොළවේ
අපි
නොසැලෙන බව...

දැන්
ලිපිනයක් ලබා ගත්තා
තව ටික දොහකින්
අපි
කරුමය වෙනස් කරනවා
එන්න..
කඳුරට දෙමළා..
අන් අයව
ජීවත් කළත්
අපිත්
ජීවත් වෙන්න
මඟක් පාදමු..



**ගෝපාල් ප්‍රේම්කුමාර්**



# විශාල සේවාවක්

**ආරුමුගම් සරවනභවන්**
ලේකම් - අඹගමුව ප්‍රාදේශීය සභාව



අඹගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් හැටියට මම අවුරුදු 8ක් තිස්සේ සේවය කරනවා. ලංකාවේ දෙවෙනි විශාලතම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අඹගමුවයි. මෙහි 88%ක් ම ජීවත් වෙන්නේ දෙමළ ප්‍රජාව. ඉතිරි 12% ක් තරම් ප්‍රමාණයක් තමා අනෙකුත් ජන කොට්ඨාස ජීවත් වෙන්නේ.

නොයෙක් අමාත්‍ය හරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවලදී වතුවල ජනයා සමඟ සාකච්ඡාකොට තමා ඒ දේවල් ක්‍රියාත්මක කරන්න වෙන්නේ. විවිධ වෘත්තීය සමිති සහ දේශපාන නියෝජිතයින් හරහා පණිවිඩ යවල තමා ජනතාව එක් රැස් කර ගන්නේ. අවුරුදු ගණනාවක් තිසේසේ මේ වතු ජනයාට ලිපිනයක් නොමැතිකම විශාල ගැටලුවක් වෙලා තිබෙනවා. පළාත් පාලන අයාතනය හැටියට අපිත් ඒ ගැටලුවට මුහුණ දෙනවා. වතු ජනයාට නිසි වෙලාවට ප්‍රාදේශීය සභාවේ කිසිදු දැනුම්දීමක් කරන්න වෙන්නේ නැහැ. නිත්‍යානුකූල ලිපි ලබාදීමේ දී ද බොහෝ ප්‍රශ්න මතුවෙලා තියනවා. තාක්‍ෂණික දියුණුව නිසා දුරකථන මාර්ගයෙන් සන්නිවේදන කටයුතු කළ හැකි වුණත් රාජකාරි ලිපි ලබා දිය යුත්තේ තැපැල් මාර්ගයෙන්. එම නිසා වතු නිවාසවලට ලිපිනයන් ලබාදීම විශාල සේවාවක්. වතු ප්‍රදේශවල එක එක කොටස්වලට අංකයක්, සමඟ ලිපිනයක් ලබාදීම වැදගත් කාරණාවක්. පසුගිය කාලයේ දේශපාලන වශයෙනුත් මේ පිළිබඳ ව නොයෙකුත් සාකච්ඡා පවත්වා තිබෙනවා. කෙසේ වෙතත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මැදිහත්වෙලා මේ කටයුත්ත සිදු කිරීම අගය කළ යුතුයි.

# අපේ වත්ත ගමක් වෙලා

වී. ලක්‍ෂණා
සිසුවියක්



මම ශාන්ත ජෝසප් පාසලේ උසස් පෙළ හදාරනවා. පිට ඉස්කෝලවලට ගියාම ඒ අයට තමන්ගෙම කියල ලිපිනයක් තියනවා. අපි කියන්නේ මොකා වත්තේ කියලා. දැන් ඒ තත්ත්වය වෙනස් වෙලා. පුරවැසි සභාව හා වතු අධිකාරි එකතුවෙලා හැම නිවසකටම ලිපිනයක් දෙන්න කටයුතු කරල තියනවා. දැන් අපේ වත්ත ගමක් වෙලා. දැන් අපේ වත්තේ හැම ලැයිමකට හොඳ නමක් තියනවා. ඉස්සර කාටවත් ලියුම් ආවේ නැහැ. ඉස්සර වතු කාර්යාලයට තමා ලියුම් ආවේ. ඉස්සරට මේ තත්ත්වය වෙනස් වෙනවා. අපිට ගොඩක් සතුටුයි.



# ගොඩක් සතුටුයි

බී. ගයාත්‍රි
සිසුවියක්

ඇඩම්ස්පීක් කොටසෙ තමා මම ජීවත් වෙන්නේ. ගාඩ් මෝර් දෙමළ විද්‍යාලයේ ඉගෙනුම ලබනවා. අපේ වත්තට දිගු ඉතිහාසයක් තියෙනවා. අතීතයේ මේ වතු පාලනය කළේ එංගලන්තයෙන්. අවුරුදු ගානත තිස්සේ ලිපිනයක් තිබුණෙ නැහැ. දැන් ලිපිනයක් තිබෙනවා. වත්ත ගමක් වෙලා. ඒ ගැන ගොඩක් සතුටුයි.